**රාජාංගනය ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රාජාංගනය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට රාජාංගනය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු රු.125,000 ක් වුවත් එය රු.249,500 ක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ආදායම් ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව කපාහැරීමට අනුමැතිය ලැබී ඇති කඩකුලී රු.490,340 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් කර තිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිවිසුම් කාලයද අවසන්වී තිබුණු කර්මාන්තයක කිසිදු වැඩක් ආරම්භකර නොතිබුණු නමුත් රු.11,391,748 ක් කර්මාන්ත ණයගැති සහ කර්මාන්ත ණයහිමි වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | | වැඩ ආරම්භ නොකළ කර්මාන්ත ණයගැති සහ ණයහිමි ලෙස ගිණුම්ගත නොකළ යුතුවේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 ක උපලේඛන අනුව ආරම්භක ශේෂයන් සහ ලෙජර ගිණුම් අනුව ආරම්භක ශේෂයන් අතර රු.2,213,779 ක වෙනසක් විය. | පිළිගනිමි. | උපලේඛනවල වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.2,880,392 ක්වූ ගිණුම් විෂයයන් 04 කට අදාළව තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ලේඛන සහ සනාථ කිරීම් සපයා ගැනීමට නොහැකිවී ඇත. | ලේඛන යාවත්කාලීන කර තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 3.1 වගන්තිය | සභාව සතු සක්‍රීය වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂා චක්‍රලේඛය අනුව කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්මවූ පුනරාවර්තන වියදම රු.12,036,604 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.15,691,980 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය බැංකු ජංගම ගිණුම් 03 ක සමාලෝචිත වර්ෂය පුරාවට ලක්ෂ 10 කට වැඩි මුදල් ප්‍රමාණයක් නිශ්කාර්යව පැවති අතර එම මුදල් ස්ථාවර තැන්පත් ගිණුමක හෝ ඉතුරුම් තැන්පත් ගිණුමක ආයෝජනය කිරීමට අවධානය යොමුකර නොතිබුණි. | ඉදිරියේදී අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරමි. | අතිරික්ත මුදල් නිශ්කාර්යව තබා නොගෙන ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබෙන හිඟ කුලී ආදායම රු.4,815,473 ක් වූ අතර එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

(ආ) **බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| ආයතන 04 කින් අයවිය යුතු 2021 දෙසැම්බර් 31 දිනට හිඟ දැන්වීම් පුවරු ආදායම් රු.100,225 ක් සහ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි දුරකථන කුළුණු 09 කට අදාළව 2021 වර්ෂය සඳහා දුරකථන සමාගම් 04 කින් රු.33,000 ක් අයකර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ හුවමාරු ගනුදෙනුවලින් ලැබිය යුතු දෑ යටතේ පෙන්නුම් කරනු ලබන වර්ෂ 18 ක කාලයක සිට පැවත එන වටිනාකම රු.2,326,517 ක් වූ ගිණුම් ශේෂ 05 ක් නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂ පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි බැවින් ආණ්ඩුකාරවරයාගෙන් අනුමැතිය ලබාගෙන කපාහැරීමට කටයුතු කරමි. | නීතිමය විධිවිධාන තුළ ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පවතින ප්‍රාදේශීය සභාවෙන් බැහැරට ස්ථානමාරුවී ගිය සහ වැඩ තහනම් කර ඇති නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.115,772 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරමි. | නිරවුල් කිරීමට කටයුතු කළයුතුවේ. |
| (ඇ) | සභාවේ බැකෝලෝඩරය සමාලෝචිත වර්ෂයේ කුලියට ලබාදීම වෙනුවෙන් යන්ත්‍ර පැය 142.6 ක් සඳහා ලැබිය යුතු රු.116,200 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ පවතින ෆෝටෝන් ට්‍රැක්ටරය, ජල බවුසරය ජෙනරේටරය හා කැබ්රථය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | 2022 වර්ෂයේදී අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂිත ය. | ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අංක 53-5052 දරන කැබ්රථය 2021 ජනවාරි මාසයේදී අක්‍රියවීම නිසා අළුත්වැඩියාව සඳහා යොමුකර ඇතත් අළුත්වැඩියාව නිමකර සභාව වෙත රැගෙන ඒම සඳහා කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අළුත්වැඩියා කර සභාව වෙත ගෙන ඒමට කටයතු කරමි. | සභාව වෙත රැගෙන ඒමට ක්‍රියාකළ යුතුවේ. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන් යටතේ සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති 36 ක් සඳහා ගිවිසුම්ගත වී තිබුණු නමුත් එයින් වටිනාකම රු.7,000,000 ක් වූ ව්‍යාපෘති 06 ක් 2021 දෙසැම්බර් 31 දින වනවිටත් ආරම්භ කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති වලින් 05 ක් ගිවිසුම්ගතවී ඇතත් අවලංගු කිරීමට කටයුතු කර ඇත. අනෙක් ව්‍යාපෘතිය සඳහා ගිවිසුම්ගතවී නැත. | ක්‍රියාත්මක කළහැකි ව්‍යාපෘති සඳහා පමණක් ගිවිසුම්ගත විය යුතුවේ. |